# අපේ පුංචි සෙල්ලම් බඩු



අශ්මි මෙතුසරී බණ්ඩාර

# අපේ පුංචි සෙල්ලම් බඩු

ප්‍රථම එළිදැක්වීම - 15.11.2023
ISBN 978-624-206-628-8

අශ්මි මෙතුසරී බණ්ඩාර

# පිදුම

ඉපදුන දා පටන් මා

ආදරයෙන් ගුරුහරුකම්

ලබාදුන් මාගේ ආදරණීය අම්මාටත්,

ආදරණීය තාත්තාටත්

මගේ නංගීටත්,

මෙතෙක් මා හට ඉගැන්වූ

සියලුම ගුරුමැණිවරුන්ට හා

පියවරුන්ට

ආදරයෙන් මේ

පොත පිරිනමමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබු සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.


2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදූහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

**ශෂිකලා සේනාධීර**
**විදුහල්පතිනිය**
**මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර**
**2023.11.01**


iv

මම සෙල්ලම් කරන්න හරිම ආසයි. මමයි මගේ නංගියි හැමදාම සෙල්ලම් කරනවා. කොරෝනා වසංගතයත් සමඟ අපිට බොහෝම දිග පාසල් නිවාඩුවක් ලැබුනා. මෙම නිවාඩු කාලයේදී මට ගමට යන්නත් ගමේදී සෙල්ලම් කරන්නත් ලැබුනා. අම්මයි, අප්පච්චියි, ගමේ අත්තමයි මට ඒගොල්ලන්ගේ පුංචි කාලේ සෙල්ලම් බඩු සෑදුව හැටි මට කියා දුන්නා. මමත් ඒවා ඉගෙන ගෙන පුංචි අපේ යාළුවන්ට කියාදෙන්නයි මම හදන්නේ.



# දෙල්කොල වෙස්මුහුණක් හදමු

හොඳට හැදුනු ලොකු දෙල් කොලයක් කඩා ගත්තා. අප්පච්චිගේ උදවුවෙන් බොහොම පරිස්සමට ඇස් දෙකකුයි, නහයකුයි පුංචි කටකුයි කපා ගත්තා. අම්මාගෙන් පුංචි රෙදි පටි දෙකක් ඉල්ලාගෙන දෙල් කොලේ දෙපැත්තේ බැන්දා. දැන් මේ දෙල්කොල වෙස්මුහුණ දමාගෙන නංගිව බය කරන්නයි මම හදන්නේ.




# මගේ කොස්කොල තොප්පිය

අත්තම්මත් එක්ක මම කොස් ගහ යට කොස්කොල ඇහින්දා. අමු කොස්කොල ටිකකුත් ගහින් කඩා ගත්තා. පාට දෙකක කොස්කොල ගොඩක් එකතු කර ගත්තා. පොල්කොලයකින් ගත්ත ඉරටු කැබැලිවලින් ඒ කොස්කොල අමුනා ගත්තා. පුංචි මගේ ලස්සන කොස්කොල තොප්පිය මගේ නංගිටයි.



# පොල් කොල බඹරයක් හදමු

එක සමාන දිග අමු පොල්කොල දෙකක් කපා ගත්තා. ඒ පොල්කොල දෙක කිතරයක් විදිහට තබා ගත්තා. අම්මාගෙත් උදවු ඇතුව, පොල්කොලය නවන අතරම අනෙක් පොල්කොලය ඒ අස්සෙන් දමා ගත්තා. මේක හැබැයි ටිකක් අමාරුයි. අන්තිමට පොල්කොල කැබලි හතරම හෙමින් ඇදලා බඹරය සිරකර ගත්තා. පුංචි ඉරටුවක් මැදින් යවා මගේ පොල් කොළ බඹරය සාදා ගත්තා.



# නංගිත් බයවන පොල්කොල පැත්තෑයා



එක සමාන දිග පොල්කොල දෙකක් ගත්තා. පොල්කොල දෙකේම අග කටුවක් ගසා සිරකර ගත්තා. එකින් එක උඩට වන ලෙස පොල්කොලය එක උඩ එකක් නවා ගත්තා. පොල්කොල දෙකේම අග පත්තෑ ඔළුවක් වගේ සවි කර ගත්තා.



# පුංචි මගේ කුරුම්බැට්ටි මැෂිම

අත්තම්මා මට බිම වැටුනු කුරුම්බැට්ටියක් අහුලා දුන්නා. අත්තම්මා මට පුංචි දිග ඉරටුවක් කුරුම්බැට්ටියේ උඩ සවිකර දුන්නා. තවත් ඉරටු දෙකක් මම අත්තම්මා කියාදුන් විදිහට කුරුම්බැට්ටියට සවිකලා. තවත් ඉරටු කූරු දෙකක් මේ විදිහට සවිකලා. ටක... ටක... ටක... ටක............. මගේ කුරුම්බැට්ටි මැෂිම දන් හොඳට වැඩ.





# පුංචි සරුංගලයක් හදමු

අමු පොල්කොල හතරකින් පොල් ඉරටු කීපයක් අප්පච්චි වෙන්කර දුන්නා. මම ඒ ඉරටු දෙකක් නූලිකන් එකට බැන්දා. ඒවාගේ අනික් ඉරටු දෙකත් නූලකින් බැන්දා දැන් කතිර හැඩයට ඉරටු දෙක තියලා, තවත් නූලිකන් ගැට ගැසුවා. අප්පච්චි ඒ ඉරටු දෙකේ කොන් හතර නූලකින් ගැට ගැසුවා. ඊට පස්සේ අම්මායි මමයි නංගියි සරුංගලයේ කොළ ඇලෙව්වා. නංගි තමයි රැලි ඇලෙව්වේ.



# පුංචි මගේ සෙල්ලම් දුන්න

අත්තම්මාගේ උණ පදුරින් පුංචි උණ බටයක් කපා ගත්තා. එම උණ බටයෙන් උණ පතුරක් අත්තම්මා වෙන් කර දුන්නා. එම උණ පතුරේ පුංචි කට්ටක් කපා නූලක් ගැටගැසුවා. මගේ පුංචි දුන්න සූදානම්. හැබැයි, මම නංගිත් එක්ක දුනු සෙල්ලම් කරන්න ගියේ නෑ. මොකද දුනු ඊතල සෙල්ලම පුංචි අපට ලොකු වැඩි නිසා.



# අප්පච්චි සෑදූ කැටපෝලය


පුංචි දෙබලක් ඇති අත්තක් කපා ගත්තා. පොඩි රබර් පටියක් නංගිගේ පරණ බයිසිකලෙන් කපා ගත්තා. ඒ රබර් පටිය පුංචි ලී දෙබලේ සවිකලා. දැන් කැටපෝලය සූදානම්. වත්තට එන වඳුරු පැටවු බය කරන්න කැටපෝලයෙන් පුළුවන් කියලා අප්පච්චි කීවා.











# මගේ පොල්පිති වස්සා

අප්පච්චි බිම වැටිච්ච පොල් පිත්තක් සොයාගෙන ආවා. පොල් පිත්ත කපලා පොල් ලෙල්ලකින් අං දෙකක් දැම්මා.

නංගි පොත් පිති වස්සාට කන්න තන කොළ දැම්මා.











# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

**මෙයට**
**සෙනෙවිරත්න මහලේකම්**
**පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක**
**2023.11.01**